

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

වාර්ෂික කාර්යසාධන වාර්තාව
2023

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
තැ.පෙ.14, පේරාදෙණිය

පටුන

01. පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01.

02. පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 02.

03. පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 03.

04. පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 04.

05. පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 05.

06. පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 06.

07. පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 07.

08. උද්භිද උද්‍යාන භාර අරමුදල - වාර්ෂික කාර්ය සාධනය 08.

කාර්ය සාධන වාර්තාව 2023
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරෝගාමී ආයතනය වේ. ශාක විතැන් සංරක්ෂණය සහ ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු,උද්‍යාන අලංකරණ පිළිබඳ විද්‍යාත්මක කටයුතු ප්‍රවර්ධනය සඳහා වන පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා හඳුන්වා දීම, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විශාල දායකත්වයක් ලබාදෙන අතර ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශනය දිනාගත් ස්ථානයන් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යානයන් වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ පිහිටි හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අමතරව මෑතකාලයේදී පිළිවෙළින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට පිහිටි මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ලෙහි පිහිටි සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන උද්භිද උද්‍යාන තුළ ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුළින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් මෙම සංරක්ෂිත ශාක අතරට ඇතුළත් ය. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත වන ඖෂධ උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනයකිරීම පිණිස දායක වන පුරෝගාමී ආයතනය වේ.

උද්භිද විද්‍යාත්මක සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් සහ සත්‍යබව තහවුරු කිරීමේ කාර්යයන් කරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා සංවර්ධන සහ පර්යේෂණ අංශය විසින් මල්වගා පර්යේෂණ කටයුතු සහ විවිධ මල්වගා සංවර්ධන වැඩසටහන් සිදුකරමින් ඒ හරහා රට තුල මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධන කටයුතු සිදුකෙරේ. කෙටිකාලීන පුහුණු පාඨමාලා,එක්අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබා දීම, ලොව පුරා ශාක වල විවිධත්වය සහ ශාක රාජධානියේ අලංකාරීත්වය රස විඳීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත ඔවුන් සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුළින් සිදුවන මහඟු කාර්යයකි.

1.2 . ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.

මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුළ ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය, අගය කිරීම තුළින් ශාක සම්පත ජනතාවට සමීප කරවීම.


අරමුණු

- ශ්‍රී ලංකාවේ මල්වගාව කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ යටිතල පහසුකම් සැපයීම.
- ශාක සම්පත් විද්‍යාත්මකව නිවැරදිව සත්‍යාපනය කිරීම තුළින් නෛතික මෙන්ම ශාක ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය සහය ලබාදීම.
- තිරසර සංචාරක සංවර්ධනය හා ප්‍රවර්ධනය තුළින් දේශීය ආර්ථික සහ සමාජ සංවර්ධනයට සෘජුව දායක වීම.
- ශ්‍රී ලංකාවේ ශාක සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය සම්බන්ධව අනාගත පරපුර දැන්වත් කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා විතැන් සංරක්ෂණ ක්‍රමවේද සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව සහ ශාක සම්පත් හා බැඳී පවත්නා වූ විවිධ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරැදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ මල්වගා කටයුතු සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත් හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
- සුදුසු ස්ථාන වල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම.
- අලංකරණ උද්‍යාන විද්‍යාත්මක කටයුතු ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණික වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂ ලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- අනුරාධපුර ජය ශ්‍රී මහබෝධීන් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම.

ජාතික උද්භිද උද්‍යාන පොර්ෂමේන්තුව - පසුගිය කාර්ය මණ්ඩලයේ සංවිධාන තැලැස්ම



1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන සහ ඒකක

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

1821 දී ස්ථාපිත පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දෙමින් ශාක පිළිබඳ අධ්‍යයනයන්ට හා සංරක්ෂණ කටයුතු සඳහා දායකත්වයක් ලබා දෙයි.

හෙක්ටයාර 61.25ක් වූ උද්‍යානය මහනුවර නගරය සමීපයෙහි පිහිටා ඇති අතර, ශාක පිළිබඳ අධ්‍යයනයන්ට, උද්භිද හා පරිසර විද්‍යාත්මක පර්යේෂණයන්ට, විවිධ වටිනා, ඓතිහාසික වටිනාකමක් ඇති වඳවී ගොස් ඇති, තර්ජනයට ලක් වී ඇති ශාක ප්‍රදර්ශනයට මෙන්ම මහජනතාවට විනෝදාස්වාදය ලබා දීමට ද දායක වන ස්ථානයක් ලෙස ප්‍රචලිත ය.

ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක්රැස් කර ඇති ස්ථානයකි. වෙනත් බොහෝ විදේශික ශාක සහ අනෙකුත් වගා කරන ශාකවල නිදර්ශක 160,000 ආසන්න ප්‍රමාණයක් යෝග්‍ය තත්ත්වයන් යටතේ ක්‍රමානුකූල අධ්‍යයනය සහ විමර්ශන කාර්යයන් සඳහා සංරක්ෂණය කරමින් තබා ඇත. 3,500 පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධ වූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේ තැන්පත් කර ඇත.

ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක, ශාක වර්ගීකරණ පර්යේෂණ සඳහා මෙන්ම ඒව විවිධත්ව අධ්‍යයන කටයුතු සඳහා දත්ත බැංකුවක් ලෙසද ශාක හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා යොදා ගනී.

හක්ගල උද්භිද උද්‍යානය

හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1861 දී ආරම්භ කරන ලද අතර උද්‍යානයට අයත් බොහෝ ශාක සෞම්‍ය කලාපීය ශාක වේ. මෙම ශාක එකතුව ශ්‍රී ලංකාවට ආවේණික ශාකවල මෙන්ම වෙනත් රටවලින් හඳුන්වා දුන් කඳුකර හා ඒ ආශ්‍රිත ශාක වල එකතුවකි. මේවා උද්‍යානයේ විවිධ අංශවල ක්‍රමානුකූලව සිටුවා ඇත.

ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. ඉතා පැරණි ඉතිහාසයක් ඇති එය උද්භිද විද්‍යාත්මකව හා උද්‍යාන විද්‍යාත්මක වශයෙන් ආකර්ෂණීය ස්ථානයකි. එය ගම්පහ පිහිටා ඇති අතර, වපසරිය හෙක්ටයාර 17.4 කි. ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල ශාක විශේෂයන් 2000 ක පමණ සංකලනයකින් මෙම උද්‍යානය සමන්විත වේ.

මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය, පේරාදෙණිය

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන අංශය, මල්වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කැපවී සිටී.

ශ්‍රී ලංකාවේ මල් වගාකරුවන් දිරිමත් හා සවිමත් කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍රයේ උපදේශන සේවා හා ආයෝජන අවස්ථා පිළිබඳව තොරතුරු, උපකරණ සහ තත්ත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා දීම සඳහා මෙම ඒකකය ක්‍රියාකාරීව දායක වේ.

ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

1950 වර්ෂයේ ආරම්භ කරන ලද ගනේවත්ත වන ඖෂධ උද්‍යානය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. උද්‍යානය හෙක්ටයාර 21.04 ක වපසරියකින් යුක්ත වන අතර, ඖෂධ පැළෑටි විශාල ප්‍රමාණයක් උද්‍යානය තුළ දැකිය හැක . ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පහසුවෙන් සොයා ගත නොහැකි දුර්ලභ ඖෂධීය පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළෑටි ක්‍රමවත්ව වගා කිරීම සහ පැළෑටි එකතු කිරීමේ ක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙහි නිරත වී සිටියි.

මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය

දේශීය විශේෂඥයින් විසින් අවුරුදු 130 කට පසු සැළසුම් කොට බිහි වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය හෙක්ටයාර 121.406 ක වපසරියකින් පමණ වන මෙය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර එහි සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2013 වර්ෂයේ දී මහජනතාවට විවෘත කරන ලදී . වියළි සහ ශුෂ්ක කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට දායක වීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වේ.

සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය

අවිස්සාවේල්ල ප්‍රදේශයට ආසන්නව මෙම උද්‍යානය පිහිටා ඇති අතර, සංවර්ධන කටයුතු 2008 වසරේදී ආරම්භ කරන ලද අතර 2015 දී මහජනතාවට විවෘත කරන ලදී. උද්භිද උද්‍යානය හෙක්ටයාර 42.49 වපසරියකින් යුක්ත ය.
පහතරට තෙත් කලාපීය ශාක විතැන් සංරක්ෂණය කිරීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වී ඇත. විවිධ ශාක විශේෂවල ආර්ථික, සෞන්දර්යාත්මක සහ පරිසර විද්‍යාත්මක ලක්ෂණ විදහා දක්වමින් පුද්ගලයන් සඳහා විනෝදාස්වාදය ගෙන දෙන ආකර්ශනීය ස්ථානයක් ලෙස මෙම උද්‍යානය එහි කාර්යයන්

සහකාර අධ්‍යක්ෂ කාර්යාලය , නාරාහේන්පිට.

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි මල්වගා කරුවන්ගේ ‘‘සුවහස් මල්’’ සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය සඳහා පහසුකම් සැලසීම නාරාහේන්පිට පිහිටි ″සුවහස්මල් ’’ඒකකයෙන් සිදු කරනු ලබයි.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස බද උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුර පිහිටි නිල නිවාස උද්‍යානයන් සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිලනිවාසබද උද්‍යානයන්හි නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්

පළමු සහ දෙවන ලෝක යුද්ධයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශවල පවත්වා ගෙන යන අතර දෙපාර්තමේන්තුව මගින් යුධ සොහොන් ඒකක උද්‍යානවල කළමනාකරණ කටයුතු සිදු කරනු ලබයි.

හරිත පියස පුහුණු මධ්‍යස්ථානය, මීගලෑව

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය හෙක්ටයාර 2.43 කි. එය දැනට සංවර්ධනය වෙමින් පවතී. මල් වගාව පිළිබඳව පාඨමාලා පවත්වාගෙන යන අතර ශාක ප්‍රචාරණය සිදුකරන මධ්‍යස්ථානයක් ලෙස ද කටයුතු කරනු ඇත.

1.6 මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය - 2023

රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

- නිළධාරීන්ගේ සේවා තෘප්තිය වැඩිදියුණු කිරීම සඳහාත් ඔවුන්ගේ නවාතැන් පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද නො. 1080 නිල නිවාසයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු මෙම වසරේදී නිම කරන ලදී.
- උද්‍යානයට පැමිණෙන කුඩා දරුවන්ට ශාක හා පරිසරය සමග බැඳුනු නවමු අත්දැකීම් ලබාගැනීමේ අරමුණින් ළමා අධ්‍යාපන උයන සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදුකරන ලදී.



මා ඔය ජල සැපයුම් පද්ධතියේ සංවර්ධන කටයුතු සිදු කිරීම

- උද්‍යානයේ ආකර්ෂණය සහ පිළිවෙළ වැඩිදියුණු කිරීම සඳහා උද්‍යානයේ භූමි සංවර්ධන කටයුතු ලෙස ජපන් උයන අලුත්වැඩියා කිරීම්, කම්කරු නිලනිවාස අළුත්වැඩියා කිරීම්, ප්‍රරෝහන කුටිය අළුතවැඩියා කිරීම්, විදුලි සැපයුම් යාවත්කාලීන කිරීම්, පොදු ගොඩනැගිල්ල සඳහා අමුද්‍රව්‍ය මිලදී ගැනීම් ආදී කටයුතුද සිදු කරන ලදී.
- කාර්යාල කටයුතු පහසුකර ගැනීම සඳහා ස්ථාපිත කාර්යාල අභ්‍යන්තර දුරකථන පද්ධතිය නැවත ස්ථාපනය කිරීම් කටයුතුද මෙම වර්ෂයේදී නිම කරන ලදී.
- උද්‍යානවල විකාශනය, උද්‍යාන පිළිබඳ ඉතිහාසය හා උරුමය පිළිඹිඹු කිරීමේ අරමුණින් ස්ථාපිත කරන ලද කෞතුකාගාරයේ එළිමහන් ප්‍රදේශ සංවර්ධන කටයුතු සඳහා ටෙන්ඩර් ප්‍රදානය කරන ලද අතර පැවති අධික වර්ෂාව මත එහි වැඩකටයුතු නිමකිරීමට නොහැකි වූ අතර එම කටයුතු 2024 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.



කෞතුකාගාරයේ එළිමහන් ප්‍රදේශවල සංවර්ධන කටයුතු සිදු කිරීම.

- උද්‍යානයේ ශාක නඩත්තු කටයුතු සඳහා ජල සැපයුම් ලබාගැනීමේ අරමුණින් මා ඔය හරහා ජලය ලබා ගැනීමේ ව්‍යාපෘතියේ මූලික වැඩකටයුතු ආරම්භ කරන ලද නමුත් එයද වර්ෂය පුරාම පැවති වර්ෂා තත්ත්වය මත ඒහි වැඩකටයුතු නිමකර ගැනීමට නොහැකි වූ අතර එය 2024 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.
- උද්‍යානයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සමරු තිළිණ ලබාගන්නා ලක්සල ගොඩනැගිල්ලෙහි වහලයේ අළුත්වැඩියා කිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර එයද වර්ෂය පුරාම පැවති වර්ෂා තත්ත්වය මත වැඩකටයුතු නිමකර ගැනීමට නොහැකි විය. එම කටයුතු 2024 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 99,405 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය - ගම්පහ

- උද්භිද උද්‍යානයේ යටිතල හා මහජන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම වසරේදී ද සංවර්ධන වැඩසටහන් සිදු කරන ලදී.
- උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ගේ පහසුකම් තව දුරටත් ඉහළ නැංවීමටත් උද්‍යාන නව ප්‍රවේශ මාර්ගය සඳහා ස්ථාපිත ආරක්ෂිත ගේට්ටුවෙහි ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.



උද්‍යාන නව ප්‍රවේශ මාර්ගය සඳහා ස්ථාපිත ආරක්ෂිත ගේට්ටුව

- උද්‍යානය සඳහා ජල සැපයුම් සිදුකරන ජල ටැංකියෙහි වැඩකටයුතු 60 % ක් පමණ මෙම වර්ෂයේදී නිම කරන ලද අතර වර්ෂය පුරාම පැවති වර්ෂා තත්ත්වය ඉදිකිරීම් වැඩකටයුතු ප්‍රමාද කිරීමට හේතු වූ අතර එය 2024 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.
- උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ගේ පහසුකම් තව දුරටත් ඉහළ නැංවීමටත් උද්‍යානයේ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම උදෙසාත් ආරම්භ කරන ලද නව වැසිකිළි පද්ධතියෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර පැවති අධික වර්ෂා තත්ත්වය මත අත්තනගලු ඔය පිටාර ගැලීම හේතුවෙන් එහි වැඩකටයුතු නිම කිරීමට නොහැකි වූ බැවින් 2024 වර්ෂයේදී එම කටයුතු නිම කිරීමට බලාපොරොත්තු වේ.



නිමවෙමින් පවතින ජල ටැංකිය

- තත්ත්වයෙන් උසස් ශාක එකතූන් නිෂ්පාදනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පැල තවාන් ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කරන ලද අතර උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 29,900 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

හක්ගල උද්භිද උද්‍යානය

- උද්‍යානයේ වැඩ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා නව උද්‍යාන උපකරණ මිලදී ගැනීම් කටයුතුද සිදු කරන ලද අතර උද්‍යානයේ තත්ත්වය හා ආකර්ෂණය වැඩිදියුණු කිරීම සඳහා ගිම්හාන කුටි තීන්ත ආලේප කිරීම්, ගොඩනැගිලි සහ නිල නිවාස තීන්ත ආලේප කිරීම් ආදී ක්‍රියාකාරකම් රාශියක් මෙම වසර තුලදී සිදු කරන ලදී.



භූමියේ ඉඩම් සංවර්ධන කටයුතු සිදු කිරීම

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 211,392 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍ය ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් නගා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී.



මල්වගාව පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කරමින්

- දිවයින පුරා දැනට මල්වගා ව්‍යාප්තිය සඳහා ක්‍රියාත්මක වන මල්වගා සංගම් ප්‍රමාණය 216 ක් වන අතර ඒ හරහා සාමාජිකයින් විශාල ප්‍රමාණයක් ප්‍රතිලාභ ලබයි. මල්වගා අංශය මගින් ක්‍රියාත්මක කරන ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බරා,කැපූ පත්‍ර වගාවන් සහ පටක රෝපණය ආදී එක් දින මල්වගා පුහුණු පාඨමාලා හරහා පුද්ගලයින් 11,881 දෙනෙකු පුහුණු කර ඇත.
- මල්වගා සංවර්ධන හා පර්යේෂණ ඒකකය මගින් ඕකිඩ්, ඇන්තූරියම්, විසිතුරු පත්‍රික ශාක 152,136 කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.
- මල්වගා කරුවන්ගේ මල්පැළ සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ මට්ටමේ ප්‍රදර්ශන 215 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ මහා පරිමාණ ප්‍රදර්ශන 18 ක් පවත්වන ලදී. මල්වගා කරුවන්ගේ පැළ තවාන් 1,239 කට ගොස් ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබා දෙන ලදී.



පවත්වන ලද මල්වගා ප්‍රදර්ශනයක ස්ථාපිත මල් පැළ ප්‍රදර්ශන කුටියක්

- රටෙහි මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදුකරන ලද අතර වර්තමානයේ වගාකරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා පර්යේෂණ 17ක් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව වාණිජමය මල්වගාව, තවාන් පාලනය, වගාවන් සම්බන්ධ පලිබෝධ සහ රෝග කළමණාකරනය ආශ්‍රිතව පැන නගින ගැටළු සම්බන්ධව පුද්ගලයින් සහ ආයතන සඳහා අය කිරීමකින් තොරව උපදේශන කටයුතු සිදු කරන ලදී.

- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා කෘෂිකර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව එක්ව සංවිධානය කරන ලද මල් වගා පර්යේෂණ පිළිබඳ වාර්ෂික ජාතික සම්මන්ත්‍රණය (NaSFLOR-2023), 2023 දෙසැම්බර් 22 වැනි දින පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යාන පරිශ්‍රයේ දී පවත්වන ලදී. මල් වගා ක්ෂේත්‍රයට අදාලව නවතම හා කාලීන පර්යේෂණ සොයාගැනීම් එළිදැක්වීම සහ සාකච්ඡා කිරීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණ විය. මෙවර "Harvesting Tomorrow: Applied Research in Floriculture for a Sustainable Future," යන තේමාව කේන්ද්‍ර කරගත් සම්මන්ත්‍රණය, මල් වගා කර්මාන්තයේ තිරසාරභාවය සහ ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයන් සහ මල් වගාවේ ගැටළු සඳහා ප්‍රායෝගික විසඳුම් ලබාදීම පිළිබඳ සාකච්ඡා කෙරුණි. මෙහිදී ශාක හා රසායනික පිළියම් භාවිතා කිරීම, ශාක ක්ෂුද්‍ර ප්‍රචාරණය සහ ශෂ්‍ය විද්‍යාව හා සාම්ප්‍රදායික ශාක ප්‍රචාරණය යන ක්ෂේත්‍ර ඔස්සේ කළ සොයාගැනීම් එළිදක්වන පර්යේෂණ පත්‍රිකා 18ක් ඉදිරිපත් කරන ලදී. මල් වගා ක්ෂේත්‍රයට අදාල පර්යේෂකයන්, වෘත්තිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පාර්ශ්වකරුවන්ගෙන් සම්මන්ත්‍රණ සභාව සමන්විත වූ අතර ඊට 170ක පමණ පිරිසක් සහභාගී විය.මෙම NaSFLOR-2023 වැඩසටහන ශ්‍රී ලංකාවේ මල් වගාව වඩාත් තිරසාර සහ ශක්තිමත් අනාගතයක් වෙත මෙහෙයවීමේ වේදිකාවක් ලෙස දැනුම බෙදාහැරීමට සහ පර්යේෂකයන් හා වෘත්තිකයන් අතර සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා දායක වූ වැදගත් සංධිස්ථානයක් ලෙස හැඳින්විය හැක.



මල් වගා පර්යේෂණ පිළිබඳ වාර්ෂික ජාතික සම්මන්ත්‍රණයෙහි (NaSFLOR-2023) එක් අවස්ථාවක්



සංවර්ධනය කරමින් පවතින ඇන්තූරියම් ගෘහය

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි මල්වගා අංශයෙහි ස්ථාපිත ඇන්තූරියම් ගෘහයේ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද අතර එහි වැඩකටයුතු 2024 වර්ශයේදී නිමකිරීමට අපේක්ෂිතය.

අධ්‍යාපනය සහ පුහුණුව

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන මධ්‍යස්ථානයේ නඩත්තු කිරීම් කටයුතු මේ වසරේදී ද සිදු කරන ලදී.

- තරුණයින් 75 දෙනෙකු නවීන මල් වගා ක්‍රමවේද, භූඅලංකරණ ක්‍රමවේද පිළිබඳව ත්‍රෛමාසික පාඨමාලාව හරහා පුහුණු කරන ලද අතර එම සියලු දෙනාටම සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී.
- භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 20 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරන ලදී.
- රෝස වගාව,තවාන් කළමනාකරණය, ශාක හදුනාගැනීම, ශාක ප්‍රතිකාර කිරීම්, මල් සැකසුම්,පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 4,805ක් පුහුණු කරන ලදී.
- රැකියාගත පුහුණු වැඩසටහන් හරහා පුද්ගලයින් 118 දෙනෙකු පුහුණු කරන ලදී.

සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය - අවිස්සාවේල්ල

- උද්‍යානයේ නරඹන්නන් සඳහා පහසුකම් උද්‍යානය තුළ ඇති කිරීම, නඩත්තු කටයුතු ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සහ උද්‍යානය තුළ නව පහසුකම් ඇති කිරීම සඳහා විවිධ සංවර්ධන කටයුතු මේ වසරේදී සිදු කරන ලදී.



සංවර්ධනය කරන ලද නැරඹුම් වේදිකාව

- උද්‍යානය කරා පැමිණෙන සංචාරකයින්ට උද්‍යානයේ අලංකාරත්වය නැරඹීම සඳහා ඉදිකරන ලද නැරඹුම් කුටියෙහි ටයිල් ඇතිරීම් කටයුතු සිදුකරන ලද අතර එහි ඉතිරි වැඩ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.
- තවද උද්‍යානයට පැමිණෙන නරඹන්නන්හට පහසුකම් සැලසීම සඳහා ඉදිකරන ලද වැසිකිළි පද්ධතියෙහි ඉදිකිරීම් කටයුතු මෙම වසරේදී නිම කරන ලදී.



අලුතින් ඉදිකරන ලද වැසිකිළි පද්ධතිය

මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානය

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩිදියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, පාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංශ වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සිදු කරන ලදී.
- 2013 වර්ෂයේ දේශීය විශේෂඥයින් විසින් නිර්මිත පළමු උද්භිද උද්‍යානය වන මෙම උද්‍යානය මෙම වසරේ අභිමානවත් දසවන සංවත්සරය සමරන ලදී. මෙම දසවර්ෂ පූර්ණ වැඩසටහනට සමගාමීව






මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානයේ දසවර්ෂ පූර්ණ සංවත්සර වැඩසටහනේ අවස්ථා කීපයක්

සමූහයක් මෙම වර්ෂය තුලදී සිදු කරන ලදී. එහිදී විශේෂයෙන්ම මල්වගාකරුවන් දිරිගැන්වීම සඳහාත් ඔවුන්ගේ නිෂ්පාදන ඇලවිකර ගැනීමත් අරමුණු කර ගනිමින් මල්වගා ප්‍රදර්ශන පවත්වන ලදී. ශාක විවිධත්වය හා ජෛව විවිධත්වයේ වැදගත්කම පිළිබඳව පැසල් සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් පවත්වන ලදී. ඒ සඳහා පාසල් ළමුන් 5,061 ක් ද ගුරුවරු 407 දෙනෙකුද රාජ්‍ය නිළධාරීන් 140 දෙනෙකුද සහභාගී වූ අතර ප්‍රදර්ශන කුටි සහ වෙළඳ කුටි 28 ක් මගින් ඔවුන් සඳහා අවශ්‍ය දැනුම ලබාදීමටත් අවශ්‍ය ආහාරපාන ආදී දෑ ලබාගැනීමටත් හැකියාව ලබා දී තිබුණි.



ජල පොම්පාගාරය අසල ඉදිකරන ලද ආරක්ෂක කුටිය

- උද්‍යානය තුල ඇති දෛනිකව මහජනතාවට නැරඹිය නොහැකි පැල ගෘහයන් මහජනතාවට නැරඹීම සඳහා අවස්ථාව ලබාදුන් අතරඒ තුළින් වනෝද්‍යාන පැල තවාන්,ඕකිඩ් පැල ගෘහයන්, විසිතුරු පැල ගෘහ, ඇන්තූරියම් පැල ගෘහ ආදී පැල තවාන් තුල සිදුකරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට හැකිවිය.
- උද්‍යානයේ ආරක්ෂාව තර කිරීමේ අරමුණින් ජල පොම්පාගාරය අසල ආරක්ෂක කුටියේ සංවර්ධන කටයුතු මෙම වසරේදී නිම කරන ලදී.
- උද්‍යානයට බාහිරින් පැමිණෙන සත්ව උවදුරින් ආරක්ෂා වීම සඳහා ඉදිකරන ලද මායිම් චේන්ලින්ක් වැටෙහි සංවර්ධන කටයුතු නිම කරන ලදී.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැල නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 46,426 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.



ඉදිකරන ලද මායිම් චේන්ලින්ක් වැට

ගනේවත්ත වන ඖෂධ උද්‍යානය



උපාංග සවිකරන ලද නව වැසිකිළි පද්ධතිය

- උද්‍යානයේ බාහිර පෙනුම වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් හි නඩත්තු කටයුතු සිදුකිරීම තුළින් උද්‍යානය උසස් තත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.
- උද්‍යානය නැරඹීමට පැමිණෙන මහජනතාවට පහසුකම් සැලසීමේ අරමුණින් ඉදිකරන ලද නව වැසිකිළි පද්ධතියෙහි ටයිල් ඇතිරීම් කටයුතු, උපාංග සවිකිරීම් කටයුතු හා සෙසු නඩත්තු කටයුතු මෙම වසරේදී නිම කරන ලදී.
- උද්‍යානයේ පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 30,331 කට අධික ප්‍රමාණයක් නිපදවන ලද අතර ශාක එකතූන් අලුතින් ඇතිකිරීමේ කටයුතු ඇතුළුව ශාක එකතූන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.
- ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 599 දෙනෙකු ඖෂධශාක භාවිතය, ඒවායෙහි වටිනාකම සහ සංරක්ෂණය පිළිබඳ දේශණ පවත්වා දැනුවත් කරන ලදී.
- උද්‍යානය තුල ජල සැපයුම් කටයුතු කාර්යක්ෂම කිරීමේ අරමුණින් ස්ථාපනය කරන ලද අභ්‍යන්තර ජල සැපයුම් පද්ධතියේ ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.



උද්‍යානය තුල ස්ථාපනය කරන ලද අභ්‍යන්තර ජල සැපයුම් පද්ධතිය

මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

- ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කරන ලද අතර ඒ තුළින් පැළ නඩත්තු කිරීම්, උද්‍යානය නඩත්තු කිරීම් කටයුතු සිදු කරන ලදී.
- මෙම වසරේදී ද පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර අගය එකතු කරන නිෂ්පාදන සහ ශාක එකතූන් වැඩිදියුණු කිරීම් කටයුතු ද සිදුකරන ලදී.
- විවිධ වගාවන් පුහුණු මධ්‍යස්ථාන වගා භූමියේ ස්ථාපිත කරන ලද අතර දෛනිකව සිදු කරනු ලබන සෙසු සියළු අළුත්වැඩියා කටයුතු, සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.

- උද්‍යානයේ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 14,946 කට අධික ප්‍රමාණයක් නිපදවන ලද අතර ශාක එකතූන් අලුතින් ඇතිකිරීමේ කටයුතු ඇතුළුව ශාක එකතූන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.
- පුහුණු කටයුතු සඳහා පැමිණෙන පුහුණුලාභීන්ට පහසුකම් වර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද ක්ෂේත්‍ර නිවහනේ වහලයෙහි අළුත්වැඩියා කිරීම් කටයුතු නිම කරන ලදී.

ඉහත සඳහන් සංවර්ධන වැඩසටහන් වලට අමතරව දෙපාර්තමේන්තුව විසින් මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලයේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක, අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01, මහනුවර, නුවරඑළිය සහ අනුරාධපුර නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ අරලියගහ මැදුර නිල නිවාස උද්‍යානය සහ නුවරඑළිය නිල නිවාස උද්‍යානය ද අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්වය මනා ලෙස පවත්වාගෙන යාමේ කටයුතු ද සිදු කරනු ලැබීය.


සියළුම උද්‍යානයන්හි භූමි අලංකරණ කටයුතු නිසි පරිදි සිදුකිරීම තුලින් ද නව සංවර්ධිත ප්‍රදේශ, පාරවල්, වීදි, උද්‍යානයේ විවිධ අංශ කාර්යක්ෂමව නඩත්තු කිරීම තුලින් ද උද්‍යානයන් හි අලංකරණය හා තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

1.7. නරඹන්නන්ගේ පැමිණීම


2023 වසරේදී ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඒකක ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යන ලදී.

මෙම වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි මුලු සංචාරකයන් සංඛ්‍යාව 2,152,858 ක් වේ. මෙම සංචාරකයන්ගෙන් 1,925,129 ක් දේශීය සංචාරකයින් වන අතර 227,729 ක් විදේශීය සංචාරකයින් වේ.

1.7.1 2023 වසරේදී උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාත්මක තොරතුරු



උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදේශීය සංචාරක සංඛ්‍යාවන්



2022 හා 2023 වසරවල දී උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදේශීය සංචාරකයින්ගේ සංසන්දනාත්මක තොරතුරු

1.7.2. 2019 වර්ෂයේ සිට 2023 වසර තෙක් උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

විස්තරය	වර්ෂය				
	2019	**2020**	**2021**	**2022**	**2023**
දේශීය නරඹන්නන් සංඛ්‍යාව	2,098,202	642,573	714,493	1,773,048	1,925,129
විදේශීය නරඹන්නන් සංඛ්‍යාව	331,888	93,304	18,412	103,322	227,729
එකතුව	**2,430,090**	**735,877**	**732,845**	**1,876,370**	**2,152,858**

2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ජාතික උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගෙන් ලැබුණු මුළු ආදායම

විස්තරය		වර්ෂය			
	2019	**2020**	**2021**	**2022**	**2023**
දේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි)	130.937	67.91	64.6	143.31	224.429
විදේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි)	537.092	181.829	35.785	200.18	567.897
එකතුව (රු.මි)	**668.029**	**249.739**	**100.385**	**343.49**	**792.326**

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

- ශ්‍රී ලංකා ඉතිහාසයේ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වාර්තා කළ වැඩිම ආදායම 2023 වර්ෂයේ ලභා කර ගැනීමට හැකිවීම.
- දේශීය උද්භිද උද්‍යාන විශේෂඥයින් විසින් නිර්මිත පළමුවරට ජාතියට දායාද කල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ අභිමානවත් දසවන සංවත්සරය අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට හැකිවීම.
- 2022 වර්ෂයට සාපේක්ෂව විදේශීය සංචාරකයින් 120 % ප්‍රමාණයක් වැඩිකර ගැනීමට හැකිවීම.
- මල්වගා හා උද්‍යාන අලංකරණ ජාතික ඩිප්ලෝමාව NVQ 5 මට්ටම ආරම්භ කිරීම හා වෘත්තීය නිපුණතා සහතික නිකුත් කිරීමට හැකිවීම.
- මාර්ගගත ප්‍රවේශ පත්‍ර ක්‍රමයක් ස්ථාපිත කිරීමට හැකිවීම.

2.2 අභියෝග

- දේශීය සහ විදේශීය වශයෙන් සිදුවන ආරක්ෂක, ආර්ථික, දේශපාලනික හා සමාජීය වශයෙන් සිදුවන බලපෑම් හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීමට සිදුවන බලපෑම.
- දේශගුණික සහ පාරිසරික සාධක වෙනස්වීම්වල බලපෑම.
- නව උද්භිද උද්‍යාන පිහිටුවීමේදී සුදුසු ඉඩම් හඳුනාගැනීම සහ පවරාගැනීමේදී ඇතිවන ගැටළු.
- අන්තර් ජාතික ප්‍රචාරණය ඉහළ නංවා ගැනීමේදී මතුවන ගැටළු.
- නවීන තාක්ෂණ අවස්ථා අත්පත් කර ගැනීමේදී පවතින බාධා.
- දේශපාලනික ආර්ථික සහ සමාජීය ප්‍රතිපත්තිමය වශයෙන් සිදුවන බලපෑම. (බඳවාගැනීම් සීමා කිරීම නිසා)

2.3 ඉලක්ක

- සියලුම උද්භිද උද්‍යාන අන්තර්ජාතික ප්‍රමිති තත්ත්වයන්ට අනුකූලව දකුණු ආසියාතික කලාපයේ හොඳම උද්භිද උද්‍යාන බවට පත් කිරීම.
- ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳ ජාතික දත්ත පද්ධතිය වැඩිදියුණු කර පවත්වාගෙන යාම.
- ජාතික අණුක ජීව විද්‍යා රසායනාගාරය ඉදිකිරීම.
- පරිසර විද්‍යාත්මක අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අදාල SDG ඉලක්ක සපුරා ගැනීම.
- නරඹන්නන් සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඵලදායිතා ස්වර්ණ සම්මානය දිනා ගැනීමට කටයුතු කිරීම.
- හොඳම සංචාරක මධ්‍යස්ථානයට හිමි සහතික පත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- සැමට පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කර ජීවිතකාලය පුරාවට අධ්‍යාපන අවස්ථා ඇතිකිරීම.

- ❖ ජෛව විවිධත්ව සංරක්ෂණ, කාන්තාරීකරණය පිටුදැකීම වෘක්ෂලතා සංරක්ෂණය මගින් පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම.
- ❖ දැනට උද්භිද උද්‍යාන පිහිටුවා නැති විශේෂිත කලාපවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම.
- ❖ සුළු හා මධ්‍ය පරිමාණ මල් හා විසිතුරු පැළ ව්‍යවසායකයින් සඳහා ලබා දෙන දිරිගැන්වීම් පුළුල් කිරීම හා මල්වගා සංගම් සාමාජික සංඛ්‍යාව ඉහළ නැංවීම. හා ඔවුන්ගේ ජීවන මට්ටම ඔසවා තැබීමට දායක වීම.
- ❖ ශ්‍රී ලංකාවේ දල ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමේදී සංචාරක ක්ෂේත්‍රයේ සැලකිය යුතු දායකත්වයක් උද්භිද උද්‍යානය මගින් ලබාදීම.

03.පරිච්ඡේදය- වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

03.01. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

03.02. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

03.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

03.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිඵාදන 2023 රු.		සටහන	2023 රු.	2022 රු.	
750,000,000	ආදායම් ලැබීම්		833,193,462	388,379,319	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඕඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	833,193,462	388,379,319	
-	**මූල ආදායම් ලැබීම් (අ)**		833,193,462	388,379,319	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිති		57,230,000	333,361,000	ඒඕඒ-3
-	තැන්පතු		111,564,644	135,651,106	ඒඕඒ-4
-	ණය්තිකාරම් ගිණුම්		33,706,010	31,640,230	ඒඕඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මූල ආදායම් නොවන ලැබීම් (ආ)**		202,500,654	500,652,336	
-	මූල ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,035,694,116	889,031,655	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		248,795,769	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		786,898,347	889,031,655	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
476,197,274	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	457,434,174	460,178,184	
152,802,726	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	139,025,422	111,421,407	ඒඕඒ-2(ii)
1,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,244,498	1,320,040	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
630,500,000	**මූල පුනරාවර්තන වියදම් (ඊ)**		597,704,094	572,919,631	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
19,500,000.00	වැඩිදියුණු කිරීම්	10	8,858,414	26,944,645	
29,000,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	21,620,328	21,525,172	
70,000,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	50,251,047	74,225,000	ඒඕඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000.00	හැකියා වර්ධනය	14	493,790	437,475	
54,500,000.00	වෙනත් මූලධන වියදම්	15	32,868,196	45,050,906	
173,500,000	**මූල මූලධන වියදම් (උ)**		114,091,775	168,183,198	
	තැන්පතු ගෙවීම්		74,127,837	132,030,235	ඒඕඒ-4
	අත්තිකාරම් ගෙවීම්		28,567,225	31,132,742	ඒඕඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		102,695,061	163,162,977	
	මූල වියදම් එ = (ඊ+උ+ඌ)		814,490,930	904,265,806	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(27,592,583)	(15,234,151)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		27,592,583	15,234,151	ඒඕඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒඕඒ-3

2024 ඔක්තෝබර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	8,020,895,718	7,813,559,403
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	90,012,918	95,151,703
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**8,110,908,637**	**7,908,711,106**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(187,059,196)	(144,483,604)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		8,020,895,718	7,813,559,403
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	277,072,114	239,635,307
දළ්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**8,110,908,637**	**7,908,711,106**

පිටු අංක...7....සිට ...32... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...33.... සිට ...37.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා එනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ඇඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

.....
ගණන්දීමේ නිලධාරි
නම් :
තනතුර :
දිනය : 2024-02-14
එච්.සී.පී. ජයවීර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම් :
දිනය : 2024.02.14
ඩී.ජී.සී. නදීශා ගමගෙ
ප්‍රධාන ගණකාධිකාරි
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

2023 [illegible] 31 [illegible]

[illegible]

[illegible]

	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	833,193,462	388,379,319
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	44,773,980	38,103,292
අග්‍රිම ලැබීම්	57,230,000	333,361,000
අත්තිකාරම් අයකර ගැනීම්	32,638,834	30,472,657
තැන්පතු ලැබීම්	111,564,644	135,651,106
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,079,400,920	925,967,374
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	594,856,521	643,629,437
සහනාධාර සහ මාරුකිරීම්	51,495,546	75,545,040
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	17,717,296	22,104,747
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	248,795,769	-
අත්තිකාරම් ගෙවීම්	28,567,225	31,132,742
තැන්පතු ගෙවීම්	74,127,837	132,030,235
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,015,560,192	904,442,201
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	63,840,728	21,525,173
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
තිම්කළු ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	63,840,728	21,525,173
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	63,840,728	21,525,173
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(63,840,728)	(21,525,173)
(උ)=(ඇ) + (ඊ)	0	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි :අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය :322

රු.

ආදායම් සංකේතය	විස්තරය	මූලික ආදායම් ඇස්තමේන්තුව	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව	වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
2003.02.19	උද්භිද උද්‍යාන ආදායම	250,000,000	750,000,000	300%	2003.07.01 වන දින සිට උදිහිද උද්‍යාන වෙත ඇතුලත් වීමේ ගාස්තු සංශෝධනය කරන ලදී. (ගැසට් පත්‍ර අංක 2333/15- 2023 මැයි මස 22 වැනි සඳුදා දින)

2024.02.14

දිනය

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි /ප්‍රධාන ගණකාධිකාරි/
මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

ඒ.ජී.සී. නදීශා ගමගෙ
ප්‍රධාන ගණකාධිකාරි
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

.....

ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන

ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:

ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

ඒ.ඒ.ඩී. ජයවීර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය :322

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

රු.

වාෂර්ක ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	-	-	-	-	-	-
	(2) ප්‍රාග්ධන	-	-	-	-	-	-
	උප එකතුව	-	-	-	-	-	-
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	630,500,000	0	0	630,500,000	597,704,094	32,795,906
	(2) ප්‍රාග්ධන	169,500,000	4,000,000	0	173,500,000	114,091,775	59,408,225
	උප එකතුව	800,000,000	4,000,000	-	804,000,000	711,795,869	92,204,131
	මුළු එකතුව	800,000,000	4,000,000	-	804,000,000	711,795,869	92,204,131

Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2023

Land-9153: 6,939,156,250.00 Table: SA 82
Building- 9151: 674,594,627.82 Year: 2023
Machinary-9152: 407,144,840.51 Rpt Date 2/19/2024 10:22:41 AM
WIP-9160: 0.00 Head 322
Intangible-9154: 0.00
Lease-9180: 0.00

Ledger	category	Item	Code	Opn_Bal	Opn_Bal_Add	Transfer In	Purchase	Disposal	Balance
9151	1.1-Dwellings		61111	159,380,605.96	0.00	0.00	0.00	0.00	159,380,605.96
		Garages	****6111102	12,189,005.63	0.00	0.00	0.00	0.00	12,189,005.63
		Hotels & Restaurants	****6111106	35,680,054.54	0.00	0.00	0.00	0.00	35,680,054.54
		Quarters	****6111107	95,911,545.79	0.00	0.00	0.00	0.00	95,911,545.79
		Circuit Bunglows	****6111108	15,600,000.00	0.00	0.00	0.00	0.00	15,600,000.00
9151	1.2-Non Residential Building		61112	378,403,068.15	7,783,097.00	0.00	0.00	0.00	386,186,165.15
		Office Building	****6111201	271,234,793.91	7,783,097.00	0.00	0.00	0.00	279,017,890.91
		Schools	****6111202	33,500,000.00	0.00	0.00	0.00	0.00	33,500,000.00
		Building for Public Entertainment	****6111204	34,683,459.03	0.00	0.00	0.00	0.00	34,683,459.03
		Warehouse	****6111205	5,150,000.00	0.00	0.00	0.00	0.00	5,150,000.00
		Laboratories & Research Stations	****6111209	33,834,815.21	0.00	0.00	0.00	0.00	33,834,815.21
9151	1.3-Other Structure		61113	123,908,234.71	5,119,622.00	0.00	0.00	0.00	129,027,856.71
		Bridges	****6111302	0.00	5,119,622.00	0.00	0.00	0.00	5,119,622.00
		Sewerage Treatment Complex	****6111310	4,521,758.91	0.00	0.00	0.00	0.00	4,52
		Pumping Station	****6111311	48,256,095.47	0.00	0.00	0.00	0.00	48,256,095.47
		Farms and Agriculture related Assets	****6111312	71,130,380.33	0.00	0.00	0.00	0.00	71,130,380.33
9152	2.1-Transport Equipment		61121	95,718,000.00	0.00	0.00	0.00	0.00	95,718,000.00
		Passenger vehicle	****6112101	90,384,000.00	0.00	0.00	0.00	0.00	90,384,000.00
		Cargo vechicle	****6112102	5,334,000.00	0.00	0.00	0.00	0.00	5,334,000.00
9152	2.2-Other Machinary & Equipment		61122	116,993,244.02	191,706,378.32	0.00	2,856,154.97	128,936.80	311,426,840.51
		Office Equipment	****6112201	6,742,656.36	29,949,631.71	0.00	1,013,000.00	0.00	37,705,288.07

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම		
		100% - 90 %	75% - 89%	50 % - 74 %
1	වෘක්ෂලතා පිළිබඳ ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම			
	• ක්ෂේත්‍ර චාරිකා ගණන			√
	• හඳුනාගත් ශාක විශේෂ		√	
	• සොයාගත් නව ශාක විශේෂ			√
2	ශාක විතැන් සංරක්ෂණ කටයුතු			
	• විතැන් සංරක්ෂණය කළ ශාක විශේෂ	√		
	• ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව			√
3	පැළ නිෂ්පාදිත ප්‍රමාණය	√		
4	පර්යේෂණ සංඛ්‍යාව	√		
5	ජාතික ශාකාගාරයේ වැඩිදියුණු කිරීම්			
	• අලුත්වැඩියා කරන ලද පර්යේෂණාගාර	√		
	• නවීකරණය කරන ලද පර්යේෂණාගාර	√		
	• අලුතින් ඉදිවූ පර්යේෂණාගාර			√
	• නව ආම්පන්න මිලදී ගත් ප්‍රමාණය			√
6	අධ්‍යාපන, පුහුණු වැඩසටහන් හා තොරතුරු බෙදාදීම			
	• අධ්‍යාපන වැඩසටහන් ගණන			√
	• පුහුණු වැඩසටහන් ගණන			√
	• තොරතුරු සැපයූ පුද්ගල ප්‍රමාණය			√
7	උද්‍යාන වලට පැමිණෙන නරඹන්නන් සඳහා වන පහසුකම් ඉහළ නැංවීම			
	• පැමිණි නරඹන්නන් සංඛ්‍යාව			√
	• ජල පහසුකම් ස්ථාපිත කිරීම්වල නිමකිරීම්		√	
	• නව ගොඩනැගිලි හා ආකෘති ඉදිකිරීම්වල නිමකිරීම්		√	
8	මල්වගා සංවර්ධන කටයුතු	√		
	• පැවැත්වූ මල්වගා ප්‍රදර්ශන	√		
	• මල්වගා කරුවන්ට පැවැත්වූ පංති සංඛ්‍යාව	√		
	• මල්වගාකරුවන්ට බෙදාදුන් ද්‍රව්‍ය ප්‍රමාණය	√		
9	කාර්ය මණ්ඩල පහසුකම් ඉහළනැංවීම			
	• සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්		√	
	• මිලදී ගත් කාර්යාල උපකරණ ප්‍රමාණය	√		
	• ඉදිකරන,නවීකරණය කරන ලද කාර්යාලීය ගොඩනැගිලි	√		
	• නවීකරණය, අලුත්වැඩියා කරන ලද නිලනිවාස			√
10	ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට දායක වීම			
	• වාර්ෂික ආදායම	√		
	• දේශීය සංචාරකයින්	√		
	• විදේශීය සංචාරකයින්	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49	50-74	75-100
සියලුම තැන්හි සියලුම ආකාරයේ දුප්පත්කම තුරන් කිරීම	ශ්‍රී ලංකාවේ මල්වගා කරුවන් සවිබල ගැන්වීම	• පිහිටවූ සමිති සංඛ්‍යාව • පැවැත්වූ මල්වගා ප්‍රදර්ශන සංඛ්‍යාව • පැවැත්වූ පුහුණු පංති හා වැඩමුළු සංඛ්‍යාව • තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීම සඳහා පැවැත්වූ රැස්වීම් හා ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව • කාලීන ගැටළු විසඳීම සඳහා සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව		√	
සැමට පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කර ජීවිතකාලය පුරාවට අධ්‍යාපන අවස්ථා ඇතිකිරීම	විවිධ වයස් මට්ටම්වල මහජනතාව ශාක සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම	• පරිසර ශාක හා ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ පැවැත්වූ අධ්‍යාපන වැඩසටහන්		√	
	තරුණ තරුණියන් හට ස්වයං රැකියා අවස්ථා හා රැකියා සලසා ගැනීමට අවස්ථා සැලසීම	• උද්‍යානය තුල වෘත්තීය පාඨමාලා හරහා තරුණ තරුණියන් පුහුණු කිරීම් ප්‍රමාණය (NVQ 3,4 හරහා)පැවැත්වූ පාඨමාලා සංඛ්‍යාව		√	
ජෛව විවිධත්ව සංරක්ෂණ, කාන්තාරීකරණය පිටුදැකීම වෘක්ෂලතා සංරක්ෂණය මගින් පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම	ශාක විතැන් සංරක්ෂණය	• විතැන් සංරක්ෂණය කළ ශාක ප්‍රමාණය • වඳවී ගිය ශාක නැවත පිහිටි වාසස්ථාන සඳහා හඳුන්වා දුන් ප්‍රමාණය • දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය • දැනුවත් කළ පුද්ගලයින් ප්‍රමාණය			√
සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරී	උද්භිද උද්‍යාන ආදායම් වර්ධනය	• නරඹන්නන් සංඛ්‍යාව			√
		• වාර්ෂික ආදායම			√

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- දෙපාර්තමේන්තුව මගින් මල්වගා සංවර්ධන වැඩසටහන් යටතේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 8500 ක් පමණ සවිබල ගැන්වීමට ක්‍රියාකර ඇත. මෙමගින් තිරසර සංවර්ධන ඉලක්ක 01 වන සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම සඳහා යන ඉලක්ක ලගා කර ගැනීමට දායක වී ඇත. මේ සඳහා විශාල වශයෙන් දායක වන්නේ කාන්තාවන්ය. මෙමගින් කාන්තාවන් සවිබල ගැන්වීමද සිදුවේ. මේ හේතුවෙන් තිරසර සංවර්ධන ඉලක්ක 05 වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලගාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීමේ අරමුණ වෙත ලඟා වීමට දායක වී ඇත. මෙමගින් ස්වයං රැකියා අවස්ථා සහ ව්‍යාපාරික අවස්ථා උදාවී ඇති බැවින් ආර්ථික සංවර්ධනයට දායක වී ඇත. මෙය තිරසර සංවර්ධන ඉලක්ක 8 වන සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ වෙත ලගාවීමේදී සෘජු දායකත්වයක් ලබා දී ඇත.
- උද්‍යානය තුළ වෘත්තීය පාඨමාලා හරහා තරුණ තරුණියන් පුහුණු කිරීම් යටතේ සිසුන් 1867ක් පමණ ප්‍රමාණයක් (NVQ 3,4) හරහා විවිධ පාඨමාලාවන් යටතේ පුහුණු කිරීම් තුළින් ඉලක්ක අංක 04 වන පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථා සැලසීම යන ඉලක්කය වෙත ලඟා වීමට හැකියාව ලැබී ඇත.
- විශේෂයෙන්ම සියලුම උද්භිද උද්‍යාන වල ශාක විතැන් සංරක්ෂණය කිරීම තුළින් හා වඳවී ගිය ශාකයන් නැවත පිහිටි වාසස්ථාන තුළ රෝපණය කිරීම තුළින් ජෛව විවිධත්ව සංරක්ෂණයට මෙන්ම ප්‍රතිෂ්ඨාපනය කර ආරක්ෂා කිරීමේ කාර්යයට දායකත්වය ලබා දී ඇත. තවද 617,600 ක පැල නිෂ්පාදනය කිරීම තුළින් ශාක ආරක්ෂා කිරීමට දායකත්වය ලබා දී ඇත. ඒ තුළින් ඉලක්ක 15 වන, භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිෂ්ඨාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්තාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන ඉලක්කය වෙත ලගා වීමට සෘජු දායකත්වයක් ලබා දී ඇත.
- සමස්ථ උද්භිද උද්‍යානවල ආදායම මිලියන 900 ක් වැනි ප්‍රමාණයකට වර්ධනය කර ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික වර්ධනයට සෘජු දායකත්වයක් ලබා දීම තුළින් ඉලක්ක 8 වන, සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන ඉලක්කය වෙත ලඟා වීමට සෘජු දායකත්වයක් ලබා දී ඇත.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජේෂ්ඨ මට්ටම	34	23	11
තෘතීය මට්ටම	9	4	5
ද්විතීය මට්ටම	180	190	10
ප්‍රාථමික මට්ටම	683	533	150
එකතුව	**906**	**750**	**176**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හා අතිරික්තය බලපෑ ඇති ආකාරය

ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය පහත පරිදි දක්වමි.

	තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	කාර්යය සාධනයට සිදුවන බලපෑම
01	සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක සේවය)	10	මෙම නිලධාරීන් ඒකක හා අංශ ප්‍රධානීන් ලෙස හා යම් යම් විෂයන් සඳහා අධීක්ෂණ හා මෙහෙයුම් නිලධාරීන් ලෙස සේවය කරනු ලබයි. නමුත් මෙම නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම මල් වගා පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු , ශාඛ සංරක්ෂණ හා පර්යේෂණ කටයුතු,නව තාක්ෂණය භාවිතයෙන් ජෛව විවිධත්ව සංරක්ෂණ හා පර්යේෂණ කටයුතු ආදී තාක්ෂණික කටයුතු වඩා ඵලදායි ලෙස ඉටු කර ගැනීමට බාධාවක් වී ඇත.
02	Landscape Architect	01	නව උද්භිද උද්‍යාන ආරම්භ කිරීමේදි හා පවතින උද්‍යාන වල භූමි දර්ශ නිර්මාණය සිදු කිරීමේදිත් සුදුසු තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකු නොමැතිවීම දෙපාර්තමේන්තුවට දැඩිව බලපානු ලැබේ.
03	උද්‍යාන සංවර්ධන සහකාර (විශේෂ ශ්‍රේණිය)	04	සහකාර අධ්‍යක්ෂ නිලධාරීන්ගෙන් පසු අධීක්ෂණ කටයුතු සිදුකරන මාණ්ඩලික නිලධාරීන් උද්භිද උද්‍යාන තුල සේවය කිරීම ආයතනයේ කාර්යය සාධනය ඉහල නැංවීමට හේතු වේ. (මෙම තනතුර අභ්‍යන්තර උසස්වීම් වන බැවින් උසස් වීමට අදාල මූලික ලේඛන සකස් කර ඇත)
04	පර්යේෂණ සහකාර (විශේෂ ශ්‍රේණිය)	01	
05	තාක්ෂණ නිලධාරි (සිවිල්)	01	දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සිදු කිරීමේදි තාක්ෂණික නිලධරියෙකුගේ අවශ්‍යතාවය දැඩිව පවතී. දැනට වෙනත් ආයතනයක සේවයේ නිරත නිලධාරියෙකු වැඩ බැලීමේ පදනම මත යොදවා ගන්නා නමුත් පූර්ණ කාලීනව සේවය ලබා ගැනීමට නොහැකිවී ඇත.
06	පර්යේෂණ සහකාර	03	පර්යේෂණ කටයුතු සඳහා විද්‍යාත්මක සේවා නිලධාරීන්ට සහාය දැක්වීම මෙම තනතුරෙහි කාර්යය භාරය වන බැවින් , තනතුරු ඌණතාවය

			පර්යේෂණ කටයුතු කෙරෙහි සෘජුවම බලපානු ලැබේ.
07	සංවර්ධන නිලධාරි	40 අතිරික්ත	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව පුරෝගාමී ආයතනයක් වන බැවින් විද්‍යා හා කෘෂි උපාධිධාරීන්ද, මල්වගා කටයුතු දිවයින පුරා ව්‍යාප්ත කිරීම සඳහා ක්ෂේත්‍රය පිළිබඳව උපාධි ලබා ඇති නිලධාරීන්ද යොදවා ගැනීමේ අවශ්‍යතාවය ඇති බැවින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීම සඳහා පවතින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් බඳවා ගැනීමට සිදු වී ඇත .
08	කළමණාකරණ සේවා නිලධාරි	02	කාර්යාලීය කටයුතු සියල්ල කෙරෙහි සෘජුව බලපානු ලැබේ.
09	ගාස්තු අයකිරීමේ සහකාර	07	උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන මහජනතාව හා සෘජුව සම්බන්ධ වන මෙම නිලධාරීන් කාර්යක්ෂමව කටයුතු කිරීම දෙපාර්තමේන්තුව කෙරෙහි මහජන ප්‍රසාදය වර්ධනය කෙරෙහි බලපානු ලබයි. මෙම කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මහජනයා අපහසුතාවයට පත්වීමෙන් දෙපාර්තමේන්තුවේ කීර්තිනාමයට හානි විය හැක.
10	උද්‍යාන වැඩ මූලික	07	ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වන ප්‍රාථමික මට්ටමේ සේවකයන් අධීක්ෂණය සඳහා මෙම නිලධාරීන්ගේ හිඟය ගැටළුවක් වේ.
11	රියදුරු	06	ප්‍රධාන උද්භිද උද්‍යාන 05ක් සහ සෙසු ඒකක 16 කින් යුතු දෙපාර්තමේන්තුව මඟින් මල්වගා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ද විවිධ ව්‍යාපෘතින් රැසක්ද සිදුවන බැවින් අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වීම ආයතනයේ කාර්යක්ෂමතාවය පහළ යාම කෙරෙහි බලපානු ලැබේ.
12	කාර්යාල කාර්යය සහයක	02	දැනට සිටින සේවකයන්ගෙන් ප්‍රමුඛ කාර්යන් ඉටු කරගන්නා අතර ඇතැම් කාර්යයන් ඉටු කර ගැනීමට සේවක සංඛ්‍යාව පමාණවත් නොවන අතර, සිටින සේවකයන්ට රාජකාරි කටයුතු අධිකවීම තුළින් රැකියාවේ තෘප්තිය අඩු වීමට ද බලපානු ලැබේ.
13	ආරක්ෂක නියාමක	09	වටිනා ශාඛ හා විද්‍යාගාර වලින් යුතු උද්භිද උද්‍යාන වල ආරක්ෂාව ඉතා වැදගත් කරුණක් වන අතර ප්‍රමාණවත් ආරක්ෂක නියාමකවරුන් නොමැති වීම හේතුවෙන් පුද්ගලික ආරක්ෂක සේවාවන්හි සේවය ලබා ගැනිමට සිදු වී ඇත.
14	උද්‍යාන සුළු පරිපාලක	10	අභ්‍යන්තර උසස්වීමකි. සුදුසුකම් ලැබූ අය නොමැත.
15	ලොරි නඩත්තුකරු	01	උද්භිද උද්‍යාන විධිමත්ව නඩත්තු කිරීම සඳහා ශිල්පීය දැනුම සහිත සේවයන්ගේ සේවය අත්‍යාවශ වේ. නමුත් ඇතැම් අවස්ථාවල තාවකාලිකව මෙම සේවකයන් වෙනත් ඒකක වලට අනුයුක්ත කර සේවය ලබා ගන්නා නමුත්
16	පෙදරේරු	01	
17	බංගලා භාරකරු	01	
18	ගබඩාකරු	03	
19	ට්‍රැක්ටර් ක්‍රියාකරු	05	
20	බැටරි කාර් ඔපරේටර්	01	

21	බද්ධකරු	03	ස්ථීර සේවා ස්ථානයෙහි වැඩ කටයුතු වලට බාධා පැමිණේ.
22	ලේබල්කරු	02	
23	බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු	01	
24	ගස් නඩත්තුකරු	02	
25	තවන්කරු	02	
26	උද්‍යාන කම්කරු	97	ප්‍රධාන උද්භිද උද්‍යාන 05ක් සහ සෙසු ඒකක 16ක නඩත්තු හා දෛනික රාජකාරි කටයුතු පවත්වාගෙන යාමේදී උද්‍යාන වල කාර්යක්ෂමතාවය සඳහා මෙම පුරප්පාඩු සෘජුවම බලපානු ලැබේ.
29	පර්යේෂණ උප සහකාර	03	අභ්‍යන්තර උසස්වීමකි. සුදුසුකම් ලැබූ අය නොමැත

6.3. මානව සම්පත් සංවර්ධනය

	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)	නිමවුම / ලබාගත් දැනුම
1.	2023 වර්ෂයට සේවාරම්භක ප්‍රවේශය	40	2023.12.20	28,000.00	රාජකාරී සම්බන්ධ ධනාත්මක ආකල්ප වර්ධනය
2.	ව්‍යාපෘති සහ වැඩ සැලසුම්කරණය (පළමු අධියර)	30	2023.02.14	8500.00	අදාල විෂය සම්බන්ධ දැනුම
3.	කාර්යක්ෂමතා කඩයිම් විභාගය ඉලක්ක කර පැවැත්වෙන නිවාඩු සහ ආයතනික විනය සම්බන්ධව පුහුණු වැඩ සටහන (පළමු වැඩ සටහන)	අදාල ඒකක	2023.06.08	32,300.00	අදාල විෂය සම්බන්ධ දැනුම
4.	කාර්යක්ෂමතා කඩයිම් විභාගය ඉලක්ක කර පැවැත්වෙන නිවාඩු සහ ආයතනික විනය සම්බන්ධව පුහුණු වැඩ සටහන (දෙවන වැඩ සටහන)	85	2023.06.08		අදාල විෂය සම්බන්ධ දැනුම
5.	ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා (PL1 වන පළමු කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන	07	2023.06.13	නැත	අදාල විෂය සම්බන්ධ දැනුම
6.	ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (නිර්දේශත විෂය නිර්දේශයට අදාල කොටස් සහ උද්‍යාන අලංකරණ නව ප්‍රවණතා පිලිබඳ)	70	2023 .09.30 දින සහ 21 දින	31,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම
7.	සේවාරම්භක පුහුණුව	40	2023.11.01	9,400.00	දෙපාර්තමේන්තුව සහ එහි කාර්යභාර්ය/ තනතුරේ වගකීම් සම්බන්ධ දැනුම

	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)	නිමවුම / ලබාගත් දැනුම
8.	කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (කාර්යාල ක්‍රම සහ ලිපිගොනුකරණය)	54	2023.12.04	41,660.00	අදාල විෂය සම්බන්ධ දැනුම
9.	කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (භාන්ඩ සමීක්ෂණ කටයුතු සහ ලිපිගොනුකරණය)	54	2023.12.06		අදාල විෂය සම්බන්ධ දැනුම
10.	කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන(රාජ්‍ය සේවකයාගේ අපේෂිත හැසිරීම සහ විනය)	52	2023.12.13	23,900.00	අදාල විෂය සම්බන්ධ දැනුම
11.	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පැය 100 දෙමළ භාෂා පාඨමාලාව	67	2023.10.10	75,000.00	දෙමළ භාෂාව සම්බන්ධ දැනුම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.6	වෙනත්	අදාල නැත		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම	අදාල නැත		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍යපාලනය සඳහා කාර්යන් අභියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැසුම් සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	සාකච්ඡා කිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ප්‍රධාන කාර්යාලයේ ගිණුම් හා ආයතන අංශ වලින් පිළිතුරු ලැබී නැත	ප්‍රධාන ගණකාධිකාරී හා අධ්‍යක්ෂ පාලන දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණනවාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල්රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත්විගණකාධිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු	අනුකූල වේ		
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂයතුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදයට අනුව, වත්කම් මිලදීගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රෙල්ඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිතවාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්තික වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	-		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරතිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින්	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**පුතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකමවලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ටවලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකටවැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදුතැන්පත් ගිණුම**			
13.1	කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදුතැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත කළ තක්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තක්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කරතිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානවසම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැ ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක්වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	02/2018 ඇමණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානවසම්පත් සැලැස්මක් සකස් කොට තිබීම			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවරු කොට තිබීම	අනුකූල නොවේ	ප්‍රතිපාදන සීමාසහිත වීම නිසා සැලසුම් කල වඅඩසටහන් පැවත්වීමට නොහැකි විය	මූල්‍ය කළමණාකරණ පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණය මත ප්‍රතිපාදන සීමිත කර ඇති බැවින් රජයේ තීරණ මත මෙය සංවිධානය කරනු ලැබේ.
19.3	ඉහතසඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ (ආයතන අංශයේ සියළුම නිළධාරීන් සම්බන්ධයෙන්)		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම	අනුකූල වේ		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා වූ භාර අරමුදල

වාර්ෂික වාර්තාව - 2023 වර්ෂය

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් 1995.12.15 වැනි දින එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ගරු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලා 1996 - 02 - 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යානවලට ඇතුළුවීම සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා වූ භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රීම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනීම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනීමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

<u>උද්භිද උද්‍යාන භාර අරමුදල</u>

1. අරමුදලේ නම : ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල

2. ස්වභාවය : උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු, සුභ සාධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම

3. අදාල චක්‍රලේඛයන් : I අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව
II ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය හා 2006.12.22 දින නිකුත් කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/423 අනුව

4. ආරම්භ කළ දිනය : 1996 දෙසැම්බර් 20

5. කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය

6. බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුව : ගිණුම් අංක 0007040848

7. අරමුදලේ පරමාර්ථ:

- ✓ උද්භිද උද්‍යාන පිළිබඳව ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල ඇති ආකල්ප ප්‍රසස්ථ කිරීමට අදාලව ක්‍රියාකාරකම් සිදු කිරීම.
- ✓ පාරිසරික හා අධ්‍යාපනික ලෙස පැළෑටි සංරක්ෂණය සඳහා අර්ථවත් වැඩසටහන් ඇරඹීම හා දියත් කිරීම.
- ✓ උද්භිද උද්‍යානයනවල සේවය කරන විද්‍යාඥයින්ට තම විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩිදියුණු කරගැනීම සඳහා මූලාශ්‍රාධාර සැපයීම හා ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ ඕනෑම ද්‍රව්‍යයක් මිලදී ගැනීම.
- ✓ පැළ එකතුව වර්ධනය කරගැනීමට පියවර ගැනීම.
- ✓ තාක්ෂණික ක්ෂේත්‍රවල සිදු කරන උද්භිද උද්‍යාන සංවර්ධනයට තුඩු දෙන පාරිසරික, අධ්‍යාපනික, සංරක්ෂණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා සහාය වීම.
- ✓ විද්‍යාඥයින්ට පහසුකම් සැලසීම හා උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණෙන ජනයාට අවශ්‍ය කරන හදිසි තැනීම් ඉදිකිරීමට පියවර ගැනිම.
- ✓ විශේෂිත වූ වැඩසටහන් සඳහා පුනරාවර්තන අරමුදල් හිඟයන් පිරිමැසීම.

2023 වර්ෂයේ අරමුදලේ මුදල් ප්‍රගතිය

2023 -01-01 දිනට බැර ශේෂය	=	රු. 209,532,349.95
එකතු කළා:		
2023 වර්ෂයේ ආදායම (බැර කිරීම්)	=	රු. 88,036,497.31
එකතුව		රු. 297,568,847.26
අඩු කළා :		
2023 වර්ෂයේ වියදම් (හර කිරීම්)	=	රු. 50,268,162.31
2023.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය	=	රු **247,300,684.95**

* (මෙම ශේෂය නාමික ශේෂයක් පමණි)

අරමුදලේ ප්‍රධාන පරමාර්ථයක් වන ‘‘ශ්‍රී ලංකාව තුල හා විදේශ රටවල් තුල ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තව දුරටත් ඉහල නැංවීම’’ අරමුණු කරගෙන පහත සඳහන් කටයුතු අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2023 වර්ෂයේ දී ඉටු කරන ලදී.

- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලෙස පරිසර හිතකාමී සෞන්දර්යාත්මක දැක්ම පෙරදැරි කරගනිමින් උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් උදෙසා සිහිවටන හා සමරු තිළිණ අලෙවි කිරීම වෙනුවෙන් මෙම වර්ෂයේදී උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් යතුරු ආධාරක හා ටී ෂර්ට් මිලදි ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 0.6 ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී.





දෙස් විදෙස් සංචාරකයින් සඳහා අලෙවි කිරීමට සැකසූ යතුරුආධාරක සහ ටී ෂර්ට්

➢ **ගනේවත්ත වන ඖෂධ උද්‍යානය**

2023 වර්ෂයේ උද්‍යාන භාර අරමුදල මඟින් රුපියල් මිලියන 5.0 ක ප්‍රතිපාදන වැය කරමින් ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ අභ්‍යන්තර ජල සැපයුම් පද්ධතිය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (දැදුරුඔය ජල ව්‍යාපෘතිය) නිම කර ඇත.









ගනේවත්ත ජල සැපයුම් පද්ධතිය

➢ <u>අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය</u>

- 2023 වර්ෂයේ මල් වගාව හා උද්‍යාන අලංකරණ වැනි අංශ කෙරෙහි උනන්දුවක් දැක්වූ පාර්ශව සඳහා පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ ආදිය අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදී.

- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් NVQ Level – 5 මල්වගා හා උද්‍යාන අලංකරණය පිලිබඳ ජාතික ඩිප්ලෝමාව සහ NVQ Level – 4 උද්‍යාන අලංකරණ ශිල්පී පාඨමාලාව හා සිවු මාසික මල් වගාව හා උද්‍යාන අලංකරණ පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබා දී ඇති අතර, එම පාඨමාලාවන් යටතේ පුහුණුව ලබන පුහුණු ලාභීන් ඔවුන් ඉටු කරන ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලට අදාලව උද්‍යානයේ විවිධ අංශවල සංවර්ධන කටයුතු හා නඩත්තු කටයුතු සඳහා ඔවුන්ගේ ශ්‍රමය ලබා දීමෙන් දායක වේ. එහිදී ඇති වන මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීමට භාර අරමුදල කටයුතු කරන ලදී.

- මේ සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් රුපියල් මිලියන 1.3 ක පමණ වියදම් දරණ ලදී.





NVQ Level – 5 මල්වගා හා උද්‍යාන අලංකරණය පිලිබඳ ජාතික ඩිප්ලෝමාව හදාරණ සිසුන් පිරිසක්





NVQ Level – 5 උද්‍යාන අලංකරණය ශිල්පී පාඨමාලාව හදාරන සිසුන් පිරිසක්





සිව් මාසික මල් වගාව හා අලංකරණ පාඨමාලාව හදාරණ සිසුන් පිරිසක්

- **<u>ජාතික ශාකාගාරය</u>**

<u>2023 වර්ෂයේ දී ජාතික ශාකාගාරය මගින් සිදුකල සුවිශේෂී කාර්යන්</u>

වර්ෂ 2023 දී අභිමානවත් 200 වසක් සපුරන ශ්‍රී ලංකාවේ ජාතික ශාකාගාරය, ශ්‍රී ලංකාවේ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද උද්භිද විද්‍යා ක්ෂේත්‍රයට සුවිශේෂී වූ කාර්යභාරයන් රැසක් සිදු කරන්නාවූ ආයතනයකි. උද්භිද විද්‍යා ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා මහඟු කාර්යභාරයක යෙදෙන ජාතික ශාකාගාරය, උද්භිද විද්‍යා අධ්‍යනයන් සිදුකරන හා දේශීය ශාක පිළිබඳ උද්භිද විද්‍යාත්මකව නිවැරදි තොරතුරු ලබාදීමේ කාර්යෙහි ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ක්‍රියාත්මක වේ.


තවද ශ්‍රී ලංකාව තුළදී නිවැරදිව ශාකයක් හඳුනාගෙන, උද්භිද විද්‍යාත්මක නාමය තහවුරු කිරීමද ජාතික ශාකාගාරය මගින් පමණක්ම සිදුකරන්නාවූ ජාතික කාර්යකි.

වර්ෂ 2013 සිට අඛණ්ඩව සිදු කෙරෙන ජාතික ශාක ගවේෂණ වැඩසටහන, ජාතික ශාකාගාරය මඟින් සිදුකෙරෙන ප්‍රධානතම තාක්ෂණික වැඩසටහනක් වේ. මෙමඟින් රැස් කරන සියළු ශාක නිදර්ශක දැනට, ජාත්‍යන්තර ශාකාගාර ක්‍රමවේදයන්ට අනුව නඩත්තු කටයුතු සිදු කර පවත්වා ගෙන යනු ලබන ප්‍රධාන ශාක නිදර්ශක එකතුව (National Plant Repository) වෙත යොමු කර සංරක්ෂණය සිදු කරයි.

ජාතික ශාක ගවේෂණ වැඩසටහන මඟින් රැස්කරනු ලබන දත්ත හා ඊට අදාල විද්‍යාත්මක හා ගවේෂණාත්මක තොරතුරුද, දේශීය හා අන්තර්ජාතික වශයෙන් බොහෝ ක්ෂේත්‍රයන්ගේ විවිධ කටයුතු සඳහා සෘජු දායකත්වයක් දක්වයි. විශේෂයෙන් දේශීය වශයෙන් සිදුකරන ශාක අධ්‍යයන හා පර්යේෂණ ,දේශීය හා බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයන්හි විවිධ පර්යේෂණ සඳහාද දේශීය ආයුර්වේද නිෂ්පාදන කටයුතු වලදී හා විවිධ නෛතික කටයුතු සඳහා ශාක වල උද්භිද විද්‍යාත්මක නාමය තහවුරු කිරීමට (Plant Authentication) මෙම දත්ත මූලික වශයෙන් යොදා ගනු ලැබේ. එසේම ජෛව විවිධත්ව සංරක්ෂණ, පාරිසරික අධ්‍යයන හා වෙනත් පාරිසරික සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා මෙම ශාක ගවේෂණ වැඩසටහන තුලින් රැස් කරනු ලබන තොරතුරු හා දත්තයන් මූලාශ්‍ර ලෙස භාවිතා කරයි.

තවද ශ්‍රී ලංකාවේ සිදුවෙමින් පවතින සංවර්ධන ක්‍රියාවලියේ දී සිදුවන අවිධිමත් ක්‍රියාකාරකම් මගින්, පරිසර පද්ධතීන්ට සෘජු බලපෑම් එල්ල වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ජීවී විශේෂ වදවීයාමේ තර්ජනයට ලක් වී ඇති අතර එමඟින් විවිධ වූ පාරිසරික බලපෑම් ඇති වී තිබෙන අතර වර්තමානයේ අප මුහුණ දී ඇති දේශගුණික විපර්යාසයන් ඒ සඳහා ප්‍රායෝගික උදාහරණයක් ලෙස දැක්විය හැකිය. එම නිසා මෙම වදවීයාමේ තර්ජනයට ලක් වී ඇති ජීවී විශේෂ සංරක්ෂණය කිරීම අත්‍යවශ්‍ය කටයුත්තකි.

ඒ අනුව පරිසර පද්ධති ගවේෂණය හා අධ්‍යයනය වැදගත් වූ කාර්යක් වන බැවින් ජාතික ශාක ගවේෂණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ජාතික කර්තව්‍යයක් ලෙස සැලකිය යුතු වේ.



හක්ගල දැඩි ස්වභාවික රක්ෂිතයෙන් වාර්තාවූ **තර්ජනයට** ලක් වූ **(EN)** විශේෂ

1. Drosera lunata - 2.Dendrophthoe suborbicularis 3. Oberonia truncata 4. Christisonia subacaulis 5. Robiquetia rosea 6.Lysimachia laxa

1.2. 2023 වර්ෂයේ ශාක ගවේෂණ වැඩසටහනේ ප්‍රගතිය

තර්ජනයට ලක් වූ ශාක ගවේෂණය හා සංරක්ෂණය ප්‍රධාන ඉලක්කය කර ගනිමින් 2023 ජාතික ශාක ගවේෂණ වැඩසටහන සැලසුම් කරන ලද අතර, එය ප්‍රධාන ව්‍යාපෘති 04ක් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදි.

ව්‍යාපෘති 1- හක්ගල දැඩි ස්වභාවික රක්ෂිතය ගවේෂණය

ව්‍යාපෘති 2- ගම්පහ දිස්ත්‍රික්කයේ ශාක ගවේෂණය

ව්‍යාපෘති 3- *Diospyros* (කළුවර) ශාක ගණයේ තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය කිරීම

ඒ අනුව එක් දින ශාක ගවේෂණ වැඩසටහන් 35 ක් ක්‍රියාත්මක කරන ලද අතර 2023 වර්ෂයේ දී ශාක ගවේෂණ කටයුතු මඟින් හා ශාක හඳුනාගැනීම් (Based on exploration and Identification) මඟින් රැස්කරන ලද දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවේ සපුෂ්පීය ශාක නිදර්ශක 379 ක් රැස්කර ඇති අතර හඳුනාගත් සපුෂ්ප ශාක අතුරින් ශාක විශේෂ 40 ක් පමණ තර්ජනයට ලක් වී ඇත. තවද ලංකාවට ආවේණික ශාක විශේෂ 51 ක් හඳුනාගෙන ඇත.





විවිධ පරිසර පද්ධති තුළ ශාක ගවේෂණ කාර්යයන් වල යෙදෙමින්





ව්‍යාපෘති 1 - හක්ගල දැඩි ස්වභාවික රක්ෂිතය ගවේෂණය

ශ්‍රී ලංකාවේ දැඩි ස්වභාවික රක්ෂිත තුනෙන් තෙත් කලාපයේ ඇති එකම දැඩි ස්වභාවික රක්ෂිතය මෙය වේ. 2023 වසරේදි සිදු කරන ලද ගවේෂණ කටයුතු වලට අනුව, ශාක විශේෂ 92 ක් හඳුනාගෙන ඇති අතර ඉන් විශේෂ 36 ක් ශ්‍රී ලංකාවට ආවේණික විශේෂ වේ. 2020 රතු දත්ත ලැයිස්තුවට අනුව හඳුනාගත් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂ වලින් විශේෂ 23 ක් ස්වභාවික පරිසරය තුළින් අනාවරණය කරගත හැකි විය.



***Rhododendron arboreum* subsp.**



Medinilla



Impatiens truncata




Ranunculus

හක්ගල දැඩි ස්වභාවික රක්ෂිත යෙන් වාර්තාවූ ආවේණික විශේෂ

ව්‍යාපෘති 2- ගම්පහ දිස්ත්‍රික්කයේ ශාක ගවේෂණය


මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ රක්ෂිත වනාන්තර, සංවේදී හා ද්විතික පරිසර ප්‍රදේශ ආශ්‍රිතව සිදුකරන ලදී. ශාක ගවේෂණ 4 ක් මෙම වර්ෂය තුල සිදුකරන ලදී. 2023 වර්ෂය තුල සිදුකරන ලද ගවේෂණ මඟින් සපුෂ්ප ශාක නිදර්ශක 111 ක් සහ එක් මීවන ශාක නිදර්ශකයක් එක් රැස් කරන ලදී. ඉන් මෙතෙක් හඳුනාගෙන ඇති සපුෂ්ප ශාක විශේෂ 53 න් විශේෂ 15 ක් ශ්‍රී ලංකාවට ආවේණික වන අතර විශේෂ 7 ක් 2020 ජාතික රතු ලැයිස්තුව ට අනුව තර්ජනයට ලක්ව ඇත.



1. Horsfieldia iryaghedhi
2. Strobilanthes adenophora
3. Petchia zeylanica

ආවේණික විශේෂ

ව්‍යාපෘති 3- *Diospyros* (කළුවර) ශාක ගණයේ තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය කිරීම



(a) *D. atrata* ඵලය (b) *D. atrata* විවිධ අවධිවල ජයාංගි පුෂ්ප

දේශගුණික විපර්යාස සහ තර්ජනයට ලක් වූ ආවේණික ශාක විශේෂ වඳවීයාමේ අවදානම පිළිබඳ අධ්‍යනය හා ඉදිරි සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වන අයුරින් Botanic Gardens Conservation International ප්‍රතිපාදන හා ජාතික උද්භිද උද්‍යාන අරමුදල් යටතේ අදාළ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

2023 වර්ෂය තුළ *Diospyros atrata, Diospyros koenigii* යන විශේෂයන්ට අදාළව ශාකාගාර දත්ත හා අනෙකුත් ලිඛිත මූලාශ්‍රයන්හි සඳහන් පරිදි වාර්තාවන සියළුම ප්‍රදේශවල ගවේෂණ කටයුතු සිදු කරන ලද අතර නව ස්ථාන කිහිපයකින් ද මෙම ශාක විශේෂ සොයාගැනීමට හැකි විය. ඉහත විශේෂයන් දෙකට අයත් ශාක සාම්පල වියලි නිදර්ශක සැකසීමට සාම්පල 10ක් ද ඩී.එන්. ඒ නිස්සාරණ කටයුතු සඳහා සාම්පල 24ක් පමණ ද 2023 වසර තුළ එක්රැස් කරන ලදී. එමෙන්ම වරින් වර මෙම ශාක විශේෂයන්ට අදාළ බීජ හා අතු කැබලි ද රැස් කර ප්‍රරෝහන අධ්‍යන කටයුතු සඳහා යොදාගන්නා ලදී. තව ද, ඩී.එන්. ඒ නිස්සාරණය සඳහා මෙන්ම ඩී.එන්. ඒ ගුණනය සඳහා වන ප්‍රශස්ත ක්‍රමවේද මේ වන විට අත්හදා බලමින් සිටියි.

ඒ අනුව SSR markers යොදාගනිමින් සිදු කෙරෙන ජාන විවිධත්ව අධ්‍යනය කටයුතු හා එහි ප්‍රතිඵල ඉදිරි ශාක සංරක්ෂණ කටයුතුවලදී භාවිතා කිරීමට නියමිතය.



ඩී.එන්.ඒ. නිස්සාරණ කටයුතුවල නියැලෙන අවස්තාවක්

ව්‍යාපෘති 4- ශ්‍රී ලංකාවේ සත්‍ය කඩොලාන විශේෂ සම්බන්ධ සංසන්දනාත්මක දැව ව්‍යුහ විද්‍යාත්මක අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ කඩොලාන විශේෂවල දැව ව්‍යුහ විද්‍යාව පිළිබඳ තොරතුරු නොමැතිකම හේතුවෙන් නීතිමය ගැටළු පැනනගින විට දී දැව කොටස් විද්‍යාත්මකව හඳුනා ගැනීමේදී ඇති වන දුෂ්කරතාවය මහහරවා ගැනීමට 2023 වසරේදී දැව ව්‍යුහ විද්‍යාත්මක අධ්‍යයනය ආරම්භ කරන ලදි.

ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල තෝරාගත් කඩොලාන පද්ධති 3 ක ක්ෂේත්‍ර ගවේෂණ (මීගමුව කලපුව, මාදුගහ කඩොලාන මෝය සහ පුත්තලම කලපුව) සිදු කරන ලද අතර සත්‍ය කඩොලාන විශේෂ 17ක්, කඩොලාන ආශ්‍රිත ශාක විශේෂ සහ ලුණු වගුරු ආශ්‍රිත ශාක විශේෂ ඇතුළුව ශාක විශේෂ 54 ක නිදර්ශක එක්රැස් කරන ලදී. හඳුනාගත් විශේෂ වලින් වඳවීමේ තර්ජනයට ලක් වූ විශේෂ 6 ක් වාර්තා විය.

සත්‍ය කඩොලාන විශේෂ 16 ක හරස්කඩ (T.S.) හා දික්කඩ (L.S.) වලින් සමන්විත දැව ව්‍යුහ විද්‍යාත්මක ස්ථීර කදා 48 ක් සකස් කර ඇත.






1.*Bruguiera cylindrica* 2. *Xylocarpus granatum* 3. *Nypa fruticans*




2020 රතු දත්ත වාර්තාවට අනුව අවදානමට ලක් වී ඇති කඩොලාන විශේෂ

සත්‍ය කඩොලාන දැව ව්‍යුහ විද්‍යාත්මක අන්වීක්ෂීය ව්‍යුහය (ඩිජිටල් ඡායාරූප) කිහිපක්



Sonneratia caseolaris



Bruguiera sexangula

1.3 2023 වර්ෂයේ ශාක ගවේෂණ කටයුතුවලදී සිදු කරන ලද විශේෂ අනාවරණයන්




Xylocarpus rumphii



Lumnitzera littorea

දැඩි ලෙස වඳවීමේ තර්ජනයට ලක් වූ (CR) කඩොලාන විශේෂ

2023 වර්ෂයේ ජාතික ශාකාගාරයේ වහලය අළුත්වැඩියා කිරීම සඳහා උද්‍යාන භාර අරමුදල මඟින් රුපියල් මිලියන 1.1 ක ප්‍රතිපාදන වැය කර ඇත.





ජාතික ශාකාගාරයේ වහල අළුත්වැඩියා කිරීම

2023 වර්ෂයේදී ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සතු සියලුම බැටරි කාර් සඳහා බැටරි මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 7.5 ක ප්‍රතිපාදන උද්‍යාන භාර අරමුදල මඟින් ලබා දෙන ලදී.



උද්භිද උද්‍යාන භාර අරමුදල - 2023 වර්ෂයේ වියදම

	කාර්යය	ඇස්තමේන්තුව (රු.)	2023-12-31 දිනට මුළු වියදම (රු.)	ඉතිරි මුදල (රු.)
1	භාර අරමුදලේ වියදම	950,000.00	917,243.18	**32,756.82**
2	උද්භිද උද්‍යාන වල පහසුකම් වැඩි දියුණු කිරීමේ වියදම	11,885,000.00	9,525,111.71	**2,359,888.29**
3	පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම	6,905,000.00	6,162,859.84	**742,140.16**
4	හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම	9,410,000.00	8,014,678.09	**1,395,321.91**
5	වන ඖෂධ උද්‍යානයේ සංවර්ධන වියදම	6,000,000.00	5,048,175.00	**951,825.00**
6	තෙත් කලාපීය උද්භිද උදයානයේ සංවර්ධන වියදම	3,200,000.00	2,177,250.00	**1,022,750.00**
7	ජාතික ශාකාගාරයේ සංවර්ධන වියදම	18,800,000.00	10,377,997.22	**8,422,002.78**
8	වියළි කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම	11,500,000.00	6,695,195.24	**4,804,804.76**
9	අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථාන වියදම්	1,350,000.00	1,333,712.05	**16,287.95**
10	අක්මීමන කඩොලාන උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම	-	-	-
එකතුව		**70,000,000.00**	**50,252,222.33**	**19,747,777.67**